ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

පුවත්පත් නිවේදනය

**දේශීය වෙදකම තුළ ඉන්දියා - ශ්‍රී ලංකා සහයෝගීතාවය ඉහළ නැංවීමට අවධානය**

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ තාක්ෂණ සහයෝගීතා අංශයේ පළමු ලේකම් ආචාර්ය සුෂිල් කුමාර් මහතා 2020 ජූලි 27 වන දින ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ අතිරේක ලේකම් එච්. ඩබ්. එම්. පුෂ්පලතා මැණිකේ මහත්මිය හමුවී වෛකල්පිත වෛද්‍ය ක්‍රම සම්බන්ධයෙන් ද්විපාර්ශවික සහයෝගීතාවය වර්ධනය කිරීම පිළිබඳව සාකච්ඡා කළේය.

එසේම, මෙහිදී සෞඛ්‍ය වෘත්තිකයන් අන්තර්ජාලය හරහා පුහුණු කිරීම සඳහා ආයතනික සහයෝගීතාවය, සෞඛ්‍ය සේවා ලබා දීම සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය වැඩිදියුණු කිරීම පිළිබඳවද සාකච්ඡා කෙරිණ.

පසුගිය මාසය මුලදී, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ශ්‍රී ලංකා රජයේ හෝමියෝපති රෝහල වෙත හෝමියෝපති ඖෂධ තොගයක් ප්‍රදානය කළේය. ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතා කුසලතා සංවර්ධන වැඩසටහන යටතේ ආයුර්වේද, යෝගා සහ ස්වභාවික වෛද්‍ය ක්‍රමය, යුනානි, සිද්ධ සහ හෝමියෝපති (AYUSH) යන ක්ෂේත්‍රයන්හි නිරත ශ්‍රී ලාංකික සෞඛ්‍ය වෘත්තිකයන් ඉන්දියාවේ කෙටිකාලීන පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

*****

කොළඹ
ශක වර්ෂ 1942 ශ්‍රාවන 7
2020 ජූලි 29